# අධ්‍යාපනයෙහි නායකත්වය භික්ෂූන් වහන්සේට පූජාකිරීම

මිහිඳු මහ රහතන් වහන්සේ මෙරටට වැඩම කළ දින සිට අවුරුදු දෙදහසකට වැඩි කලක් භික්ෂූන් වහන්සේගේ නායකත්වයෙන් තිබූ අධ්‍යාපනය මේ වන විට බටහිර ක්‍රිස්තියානි නූතනත්වය යටතට මුළුමනින් ම පත් වී ඇත. පාසලේ පහළ පන්තිවල ඉතිහාසය හා සිංහල සාහිත්‍යය විෂය ලෙස නුගැන්වෙන විට අඩුම තරමින් ඒ විෂය සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේ කළ බලපෑම නැතිවෙයි. අපේ ජාතික උරුමය එසේ ශිෂ්‍යයන්ට නුගැන්වෙන විට භික්ෂූන් වහන්සේගේ නායකත්වය අධ්‍යාපනයෙන් මුළුමනින් ම ඉවත්කළ විට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අවශ්‍ය සියල්ල ඉටු වී ඇත.

අද භික්ෂූන් වහන්සේ පාසලෙහි ද විශ්වවිද්‍යාලයෙහි ද උගන්වති. එමෙන් ම අධ්‍යාපන අමාත්‍යංශයෙහි, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙහි හා වෙනත් අධ්‍යාපන ආයතනවල සේවය කරන භික්ෂූන් වහන්සේ ද වෙති. භික්ෂූන් වහන්සේ සේවය කරන්නේ යැයි කී තැනම ප්‍රශ්නයක් වෙයි. වැටුප් සහිතව හෝ රහිතව හෝ සේවය කරන්නේ ස්වාමියකුට ය. බුදුන් වහන්සේ ජනතාවට හෝ වෙනත් කිසිවකුට හෝ සේවය නො කළහ. බුදුන් වහන්සේ අනුගමනය කරමින් භික්ෂූන් වහන්සේ ද රජුට හෝ ජනතාවට හෝ සේවය නො කළහ. උන්වහන්සේ සත්වයාගේ හිත සුව පිණිස චාරිකා කළහ.

සේවය කිරීම බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි සංකල්පයකි. එහි පූජකයෝ ද අනෙක් අය ද දෙවියන් වහන්සේට සේවය කරන්නෝ වෙති. මේ සේවය කිරීම යන සංකල්පය අද බටහිර කළමනාකරණයෙහි හා වෙනත් ක්ෂෙත්‍රවල වෙයි. භික්ෂූන් වහන්සේ ද අද සේවය කරති. උන්වහන්සේ අධ්‍යාපනයෙහි නායකත්වයක් නොදරා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සේවය කරති. අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් හෝ වෙනත් ආයතනයකින් හෝ සකස්කරන විෂය නිර්දේශයකට අනුව උගන්වති; එනමින් සේවය කරති.

මේ විෂය නිර්දේශ සකස්කරන ගිහියන් එසේ කරන්නේ බටහිරයන්ට අවශ්‍ය අන්දමට ය. බටහිර විශ්වවිද්‍යාලයක හෝ වෙනත් ආයතනයක හෝ පුහුණුව ලැබූ ගිහියෝ තමන් ඉගෙනගත් ආකාරයට විෂයමාලා සකස්කරති. සකස්කිරීම යනු බටහිර රටවල් කිහිපයක නිර්දේශ සොයාගෙන ඒ අනුසාරයෙන් සුළු වෙනස්කම් පමණක් සහිතව ඒ විෂය නිර්දේශවල ම පොදු එකතුවක් නැවත ඉදිරිපත් කිරීම මිස අනෙකක් නො වේ. සේවය කිරීම යන වචනවලින් අදහස් කෙරෙන්නේ භික්ෂූන් වහන්සේ ද බටහිරයන්ට අවශ්‍ය විෂය බටහිරයන්ගේ අවශ්‍යතා පරිදි ඉගැන්වීම ය.

භික්ෂූන් වහන්සේට තමන්වහන්සේ දුන් නායකත්වය නැතිවී තිබෙන්නේ අධ්‍යාපනයෙහි පමණක් නො වෙයි. ඉතිහාසයක්, සම්ප්‍රදායක් පිරිවෙනේ ද නුගැන්වෙන බැවින් අද බොහෝ භික්ෂූන් වහන්සේ තමන් වහන්සේගේ යුතුකම් හා වගකීම් නො දනිති. එබැවින් ඇතැම් බලලෝභී දේශපාලනඥයන්ගේ ගැටවලට උන්වහන්සේ හසුවෙති. භික්ෂූන් වහන්සේ මෙරට අධ්‍යාපනයෙහි නායකත්වය ගත් අතර රජුට හා ජනතාවට අවවාද හා  අනුශාසන කළහ. එහෙත් කිසි දිනෙක රජ නො වූහ. උන්වහන්සේ රාජ සභාවේ සාමාජිකයෝ නො වූහ. භාරතයේ නම් බමුණෝ අධ්‍යාපනයේ නියමුවෝ ද රාජසභා සාමාජිකයෝ ද වූහ. එහෙත් ලංකාවේ භික්ෂූන් වහන්සේ අධ්‍යාපනයේ දී නායකත්වය දී රාජ්‍ය පාලනයෙහි දී රජුට හා ජනතාවට අවවාද අනුශාසනා දීමෙන් ඔබ්බට නො ගියහ.

එසේ වුවත් පසුගිය මැතිවරණයෙන් පසු භික්ෂූන් වහන්සේ පාර්ලිමේන්තුවෙහි අසුන් ගත්හ. ඒ සමගම උන් වහන්සේ රාජ සභා සමාජිකයෝ වූහ. මෙරට සම්ප්‍රදාය ගැන අබමල් රේණුවක තරම දැනුමක් තිබුණි නම් හෝ සම්ප්‍රදායට ගරු කිරීමක් තිබුණි නම් හෝ ඇතැම් බලලෝභීන් භික්ෂූන් වහන්සේ එවැනි තැනකට ඇද දැමීමට කටයුතු නොකරනු ඇත. ඇතැමුන්ට අනුව ඒ නව සම්ප්‍රදායක් ගොඩනැගීමක් විය. අනිත්‍ය වූ ලෝකයක සම්ප්‍රදාය පමණක් නො වෙනස්ව තිබෙන්නේ නො වෙයි. එහෙත් ප්‍රශ්නය වන්නේ සම්ප්‍රදාය වෙනස් කිරීමේ දී  සිංහල බෞද්ධකමට කුමක් සිදුවන්නේ දැයි නො සැලකීම ය.

හුදෙක් බලලෝභීත්වය නිසා ම සිංහල බෞද්ධකම බලයට පත්වීම සඳහා යොදාගත්ත ද මේ බලලෝභීන්ට තම අනිසි ක්‍රියාමාර්ග හේතුවෙන් සිංහල බෞද්ධකමට පහරවැදීම පිළිබඳ ව කිසිදු තැකීමක් නැත. භික්ෂූන් වහන්සේ

© Prof. Nalin De Silva

පාර්ලිමේන්තු යෑමෙන් පසුව සිදු වී ඇති දෑ ගැන විස්තරාත්මක වාර්තාවක් සැපයීම මෙහි අරමුණ නො වෙයි. එමෙන් ම පාර්ලිමේන්තු මන්ත්‍රීන් බවට පත්වී ඇත්තේ භික්ෂූන් වහන්සේ කිහිප නමක් පමණක් බැවින් පොදුවේ භික්ෂූන් වහන්සේට කැළලක් වී නැතැයි යන මුසාවාදය ප්‍රචාරය කිරීම ද අපට රුචි නො වෙයි. මෙහි දී අප පෙන්නුම් කිරීමට තැත්කරන්නේ භික්ෂූන් වහන්සේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වීම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අවශ්‍යතාවන්ට යටවීමක් බව ය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අවශ්‍ය වන්නේ භික්ෂූන් වහන්සේට සිංහල බෞද්ධ සමාජයෙහි ඇති ගෞරවය නැතිකිරීම ය. එමගින් පැරණි බ්‍රිතානි ආණ්ඩුකාරයන් දුටු සිහිනය සැබෑකර ගැනීම ය. අප කලින් සඳහන්කර ඇති ආකාරයට බ්‍රිතානි ආණ්ඩුකාරයන් භික්ෂූන් වහන්සේ දුටුවේ සිංහල බෞද්ධයන්ගේ උපතට, විවාහයට, මරණයට හා ජීවිතයේ වෙනත් අවස්ථාවන්ට සහභාගි වී සිංහලයන් තමන්ට යටත් කරගැනීමට නොදෙන කහකඩ හමුදාවක් ලෙස ය. භික්ෂූන් වහන්සේ ශක්තිමත් ව සිටින තාක් තමන්ට සිංහලයන් යටත් කරගැනීමට නොහැකි යැයි බ්‍රිතානි ආණ්ඩුකාරයෝ එංගලන්තයේ යටත්විජිත ලේකම් ට දැන්වූහ.

බ්‍රිතානි ආණ්ඩුකාරයන්ට අවශ්‍ය වූයේ සිංහල බෞද්ධ සමාජයේ භික්ෂූන් වහන්සේට ඇති නායකත්වය හා ගෞරවය නැතිකිරීම ය. ඔවුන්ට ඒ කටයුත්ත කර ගැනීමට නොහැකි විය. එබැවින් සිංහලයෝ දේශපාලනික ව බ්‍රිතානීන්ට යටත් වුව ද ආධ්‍යාත්මික ව යටත් නොවූහ.  එහෙත් අද වන විට සිංහල දේශපාලනඥයන් අධ්‍යාපනයෙන් භික්ෂූන් වහන්සේ ඉවත්කර උන්වහන්සේ පාර්ලිමේන්තුවට වඩම්මවා ඇත. බ්‍රිතානීන්ට කළ නොහැකි වූ දේ බ්‍රිතානීන් විසින් පුහුණු කෙරුණු සිංහල දේශපාලනඥයෝ කළහ.

අද උපදෙසක් ගැනීමට පන්සලට යන තරුණයන් ඇතැයි සිතිය නො හැකි ය. අද තරුණයන් පන්සලට යන්නේ බොහෝ විට තරුණ භික්ෂූන් වහන්ස් සමග මිත්‍ර සමාගම් පැවැත්වීමට පමණක් යැයි කීම නිවැරදි ය. වැඩිහිටියන් පන්සල් යන්නේ මෙලොවට වඩා පරලොව ගැන සිතා ය. භික්ෂූන් වහන්සේ දානයට පාංශුකූලයට සීමා වී තිබීම කණගාටුදායක ය. අද සිංහල බෞද්ධයන් ආධ්‍යාත්මික ව ද වැටී ඇත්නම් එයට ප්‍රධාන හේතුවක් වනුයේ භික්ෂූන් වහන්සේ අධ්‍යාපනයේ නායකත්වය නො දැරීම ය. උසස් පෙළ පන්තියේ විද්‍යාව වාණිජ්‍යය ආදී විෂය හදාරණ සිසුවා වුව ද සිතන්නේ තමන් පන්සලේ නායක හාමුදුරුවන්ට වඩා බොහෝ දේ දන්නා බව ය.

මේ තත්වය වෙනස් කිරීම අපහසු වුවත් බැරි නැත. ඒ සඳහා පළමුවෙන් ම කළ යුත්තේ තරුණ භික්ෂූන් වහන්සේ ට සිංහල, පාළි, බුද්ධ ධර්මය, ඉතිහාසය වැනි විෂය හොඳින් උගන්වා ඉන්පසු වාණිජ්‍යය විද්‍යාව ආදී විෂයයන් ද මැනවින් ඉගැන්වීම ය. එහෙත් ඒ සඳහා අනුග්‍රාහකයන්  අවශ්‍ය වෙයි.  එමෙන් ම ශ්‍රද්ධාවක් ඇති ගුරුවරුන් ද අවශ්‍ය වෙයි. ප්‍රධාන ප්‍රශ්නය වනුයේ ගුරුවරුන් සපයා ගැනීම ය. මේ ගුරුවරුන්ට ශ්‍රද්ධාව මෙන් ම විෂය දැනුම ද සිබීම අනිවාර්ය වෙයි. එහෙත් ඔවුන්ට එයටත් වැඩි දෙයක් තිබීම අවශ්‍ය වෙයි.

ඒ වැඩි දෙය අන්කිසිවක් නොව බටහිර දැනුම ලෝකයේ එකම දැනුම නොවන බව හා බටහිර දැනුම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ නිර්මාණයක් බව දැනගැනීම ය. බටහිර දැනුමේ චින්තනය කුමක් ද යන්න ගැන අවබෝධයක් තිබිය යුතු අතර බටහිර දැනුමෙහි දුර්වල තැන් ද දැන සිටිය යුතු ය. එසේ නැතිව අද පාසල්වල හා විශ්වවිද්‍යාලවල ඉගැන්වෙන ආකාරයට බටහිර දැනුම ඉගැන්වීමට දත් පිරිසක් ලවා භික්ෂූන් වහන්සේට ඉගැන්වීමෙන් සිදුවන්නේ  බටහිරයන්ට, ඔවුන්ගේ චින්තනයට හා දැනුමට ගැති භික්ෂූන් වහන්සේ පිරිසක් බිහිකර ගැනීම පමණ ය.

අද ඇතැම් භික්ෂූන් වහන්සේ නමක් බටහිර විද්‍යාව යම් ප්‍රමාණයකට දැනගත් පමණින් විද්‍යාවේදී ආදී අභිධානයන් සහිතව තමන්වහන්සේ හඳුන්වාදීමට පුරුදු වී සිටිති. මේ භික්ෂූන් වහන්සේ ද, බටහිර විද්‍යාව ගැන සුළුවෙන් හෝ දැනුමක් නොමැතිව ද එයට දණ්ඩ නමස්කාරකරන  භික්ෂූන් වහන්සේ ද, එවැනි වූ ගිහියන් ද අද තම ප්‍රධාන භූමිකාව කරගෙන ඇත්තේ බුදු දහම විද්‍යාත්මක බව පෙන්වීම ය. මෙහි ඇති වරද අප කලින් කියා ඇති බැවින් නැවතත් කීම අනවශ්‍ය වෙයි. අපට මෙහි දී කීමට ඇත්තේ භික්ෂූන් වහන්සේට බටහිර දැනුම ඉගැන්වීමට තෝරාගන්නා ගිහියන්ට බටහිර දැනුමේ මහේශාඛ්‍ය භාවය පිළිගන්නා හීනමානයක් නොතිබිය යුතු බව ය.

© Prof. Nalin De Silva

බටහිර දැනුමේ පදනම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය බව අවබෝධ කරගත් කිසිවකුට එයට දණ්ඩ නමස්කාර කළ යුතු නො වේ. එහෙත් මේ දණ්ඩ නමස්කාර කරන්නන් කිසිවකු තමන් එලෙස බටහිර දැනුමට දණ්ඩ නමස්කාර කරන බව නොපිළිගනු ඇත. ඔවුන් තමන් බටහිර දැනුම ඉගෙනීම හා ප්‍රචාරය කිරීම ගැන වෙනත් කතා කියනු ඇත. බටහිර දැනුමේ ඊනියා වාස්තවික බව, ඒ ලෝ පුරා ප්‍රචලිත වී ලෝකයට වැඩක් කර තිබිම ආදී දහසකුත් කරුණු ඔවුන්ට කීමට ඇත. එහෙත් බටහිර දැනුම වාසත්වික නොවන බව අප විසින් පෙන්වා දෙනු ලැබ ඇත. බටහිර දැනුම ලෝ පුරා පැතිරී නැත. එය බටහිරයන්ගේ දේශපාලන ආධිපත්‍යයෙහි ආධාරයෙන් ලෝ පුරා පතුරවා ඇත.

අධ්‍යාපනයෙහි භික්ෂූන් වහන්සේගෙන් ගිහියන්ට ලබාදුන් නායකත්වය නැවතත් භික්ෂූන් වහන්සේ අතට පත්කිරීමට සිදුවන්නේ ද ගිහියන්ට ය. එසේ වීම පුදුමයක් නො වේ. පවතින සමාජ තත්වය යටතේ ගිහියන්ගෙන් පිරිසක් හෝ තමන්ට ලැබී ඇති නායකත්වය භික්ෂූන් වහන්සේට ලබාදීමට සූදානම් විය යුතු ය. අද භික්ෂූන් වහන්සේට බටහිර දැනුම පමණක් නොව අපේ දැනුම ද ඉගෙනීමට සිදු වී ඇත්තේ ගිහියන්ගෙන් ය. එහෙත් ඒ තත්වය එලෙසින් සැමදාමත් තිබිය යුතු නොවෙයි. ගිහියන් තමන්ට හිමි වී ඇති නායකත්වය භික්ෂූන් වහන්සේට ආපසු ලබාදිය යුත්තේ ඇතැමුන් භික්ෂූන් වහන්සේට පක්ෂ පූජා කළ අයුරින් නො වේ. පූජා කළ දේ ආපසු ලබාගැනීම සිංහල බෞද්ධ සම්ප්‍රදායට එකඟ නො වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva